2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යය සාධන වාර්තාව

බහික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය 439



මෙම වාර්තාව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ටද පරිවර්තනය කර ඇත

පටුන

	පිටුව
පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	04
පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම	09
පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	13
පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශක	28
පරිච්ඡේදය 05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	29
පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ	31
පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව	34

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමෙහිලා ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය මගින් දේශීය ඇඟළුම් නිෂ්පාදනය ඉහල නංවා අපනයන මඟින් විදේශ විනිමය වැඩි කිරීමද රෙදි ආනයනය සීමා කිරීම හා දේශීය රෙදිපිළි නිෂ්පාදනකරුවන්ගේ ආදායම ඉහළ නැංවීමට මුල්තැන දෙමින් දේශීය අරමුදලින් මූල්‍යනය වන විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන ඵලදායිතාවක් හා කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් තාක්ෂණික මග පෙන්වීම ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.මීට අමතරව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන වන, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය හා සීමාසහිත ලංකා සළුසල ක්ෂෙත්‍රයේ උන්නතිය වෙනුවෙන් ඒකාබද්ධ වී ඉමහත් සේවාවක් සපයනු ලැබේ.

1.2 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර , අරමුණු

දැක්ම

ශිල්පීය දක්ෂතා සහ ගුණාත්මකභාවය තුළින් උසස් තත්වයේ ශ්‍රී ලාංකීය බතික් අත් යන්ත්‍ර රෙදි පිළි හා ඇඟළුම් නිෂ්පාදනය කිරීමෙන් ජාත්‍යන්තර රෙදිපිළි කර්මාන්තයේ ප්‍රමුඛතම තරඟකරුවෙකු වීම.

මෙහෙවර

සාම්ප්‍රදායික බතික්, අත්යන්ත්‍ර සහ ඇඟළුම් කර්මාන්තය සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් හා බිම්මට්ටමේ සිට සියළුම පාර්ශවයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට පාරිභෝගික අවශ්‍යතාවය දක්වා වූ සමස්ත ක්‍රියාවලිය සඳහා

තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය හිතකර පරිසරයක් බිහි කිරීම.

අරමුණු

- 2025 වනවිට දේශීය ඇඟළුම් අපනයනය වැඩිකර ඇමරිකානු ඩොලර් බිලියන (USD) 1.5 ක අමතර ආදායම් උපයා ගැනීම.
- 2025 වනවිට ග්‍රාමීය මට්ටමින් කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත 500 ක් ස්ථාපිත කර ඇඟළුම් කර්මාන්තයේ නියැලී සිට ඉන් ඉවත් වූ ඇඟළුම් සේවිකාවන් 9,000 ක් රැකියාවේ නිරත කරවීම.
- ජාතික උරුමයන්ගෙන් සැදුම්ලත් ආකර්ෂණීය මෝස්තර භාවිතය මගින් සංචාරක ආකර්ෂණය ඇති කිරීම තුළින් බතික් කර්මාන්ත නිෂ්පාදන 2025 වසර වන විට 50% කින් ඉහළ නංවා ගැනීම.
- නව මෝස්තර හා වර්ණ භාවිතය මඟින් සරල හා කල් පවත්නා ඇඳුම් නිර්මාණය කොට වර්ෂ 2025 වන විට පාරිභෝගික ආකර්ෂණය 40% ප්‍රතිශතයකින් ඉහළ නැංවීම.
- 2025 වසර වන විට විශ්ව විද්‍යාල ඇතුළු කාර්මික වෘත්තීය හා තෘතීය අධ්‍යාපනය තුළින් දේශීය ඇඟළුම් සම්බන්ධ පුහුණු ශ්‍රමික වෙළඳපොළ 60% ප්‍රතිශතයකින් ඉහළ නැංවීම.
- වසර 2022 වන විට ඩිජිටල් වේදිකාව (E-Platform) ස්ථාපිත කිරීම තුළින් බතික් අත්යන්ත්‍ර හා ඇඟළුම් කර්මාන්තයට හිතකර “ඊ පරිසරයක්” නිර්මාණය කිරීම.
- 2025 දී බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලියේ තාක්ෂණය 50% කින් වැඩි දියුණු කිරීම.
- තාක්ෂණික හා වෘත්තීය කුසලතාවය ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ තරුණියන්ට හා වැඩිහිටියන්ට දේශීය ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා 50,000 ක් 2025 වසර වන විට ඇති කිරීම තුළින් නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- 2025 වසර වන විට දේශීය ඇඟළුම් ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකයින් 5000 ක් බිහි කිරීම තුළින් තෘප්තිමත් හා සුවපහසු ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය


2020.10.06 දිනැති අංක 2187/27 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට පවරා ඇති විෂය පථය පහත පරිදි වේ.

කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත දේශීය කර්මාන්ත ගොඩනැඟීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අදාළ නීති හා අණපනත් වලට අනුකූලව බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා

1. ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳපොළ තුළ ඇඟළුම් නිෂ්පාදනය හා සැපයුම පුළුල් කිරීම මගින් දේශීය ඇඟළුම් සඳහා සංචාරක වෙළඳපොළ සංවර්ධනය
2. බතික් කර්මාන්තය සඳහා අවශ්‍ය ඩයි වර්ග ඇතුළු ඉහළ ගුණත්වයෙන් යුතු අනිකුත් අමුද්‍රව්‍ය අවශ්‍යතා සැපයීම සඳහා වැඩපිළිවෙළක් සැකසීම
3. දේශීය හා විදේශීය වශයෙන් බතික් හා අත්යන්ත්‍ර කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
4. රෙදිපිළි අළෙවි පුරවරයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම
5. රෙදිපිළි නිෂ්පාදන වෙළඳපොල විවෘත හා තරහකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම
6. මහා පරිමාණ දේශීය ආයෝජකයින්ට අධිතාක්ෂණික නිෂ්පාදන අළුතින් ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම

1.4 සංවිධාන සටහන


ලේකම්
අති/ලේ(පාලන)
අති/ලේ (සංවර්ධන)
ජෙ/ස.ලේ
ප්‍ර.ගනකාධිකාරී
අධ්‍යක්ෂ(සැලසුම්)
අධ්‍යක්ෂ(සං)
අභ්‍යන්තර විගණක
ස/ලේ
ගනකාධිකාරී
සහ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
සහ/ අධ්‍යක්ෂ(සං)
ලේ/සම්
පරිපාලන .නිළ
ස/ නිළ (2)
කළ/ සේ .නි (1)
තො.සං.තාක්ෂණ සහකාර
ස/නිළ 5
කළ/සේ.නි (4)
ස/නිළ (4)
කළ/සේ. නි (2)
අළෙවි ප්‍රවර්/නි 1 (තාව)
සං/නිළ(5)
කළ/සේ. නි (2)
වීඩි.කැ.ශි (තාව) 1
නිශ්.ඡා.රූ. ශිල් (තාව) 1
කැමරා.ශි.සහාක (තාව) (1)
කා.කා.ස (1)
රියදුරු (08)
කා.කා.ස (03)
කා.කා.ස (1)
කා.කා.ස
කා.ක.ස (1)

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන

දෙපාර්තමේන්තු

1) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

රාජ්‍ය ව්‍යවසායන්

1) ශ්‍රී ලංකා පේෂ කර්ම හා ඇඟළුම් ආයතනය (SLITA)
2) ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
3) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත සංවර්ධන මණ්ඩලය (LAKSALA)
4) සීමාසහිත ලංකා සළුසල(Salusala)

පරිච්ඡේදය 2

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහන, අභියෝග හා අනාගත අරමුණු

බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය ඇඟළුම් අංශයට අළුතින් පිහිටුවන ලද අමාත්‍යාංශයකි. මීට පෙර බතික් හා රෙදිපිළි විෂය වෙනම ආයතනවල විෂය පථය යටතේ විය.

බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් කර්මාන්ත ශ්‍රී ලංකාවේ හොඳින් ස්ථාපිත කර්මාන්ත විය. එබැවින් කර්මාන්තකරුවන්ට, පාරිභෝගිකයින්ට හා පාර්ශවකරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම අමාත්‍යාංශය වෙත ඇති විශාල අභියෝගයකි. රාජ්‍ය අමාත්‍යාංශයට ඇති තවත් අභියෝගයක් නම් ඉහත අංශ තුනෙහි අපනයනකරුවන් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සමගම දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීමයි.

ලෝක වෙළඳපොළෙහි තරඟ කිරීම සඳහා ශ්‍රී ලංකාව අපනයනකරුවන් ප්‍රවර්ධනය කිරීම කළ යුතුය. මේ අතර දේශීය වෙළඳපොළ පුළුල් කිරීම මෙන්ම අමාත්‍යාංශය විසින් දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කළ යුතුය. ඒ සඳහා තිරසාරත්වය සඳහා අඛණ්ඩතාව සමග දේශීය වෙළඳ නාමවල අවශ්‍යතාව තීරණාත්මකය.

එබැවින් විශේෂිත ගුණාංග හා ප්‍රමිතීන් සහිත වෙළඳ නාම සහ දේශීය වෙළඳපල සමඟ විදේශ වෙළඳපොළ වැඩිදියුණු කිරීමට අමාත්‍යාංශය පියවර ගත යුතුය.

ඒ අනුව දේශීය කර්මාන්තකරුවන්ට හා අපනයනකරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් රාජ්‍ය අමාත්‍යාංශයට තිබීම අවශ්‍ය වේ.

විශේෂ ජයග්‍රහණ

- දැනුම හා තාක්ෂණය බතික් කර්මාන්තකරුවන්ට පැවරීම සඳහා බතික් පුහුණු මධ්‍යස්ථාන 60 ක් පිහිටුවීම.
- කර්මාන්තකරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අමාත්‍යාංශයට නව වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම.
- බතික් සහ අත්යන්ත්‍ර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා භාවිතා කිරීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන වෙත චක්‍රලේඛණයක් හරහා දැනුවත් කර ඇත.

2021 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති වල ප්‍රගතිය.
(දෙසැම්බර් මස 31 දිනට)

අනු අංකය	වැඩසටහන / ව්‍යාපෘතිය	2021 අය වැය ප්‍රතිපාදන (රු.මි)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය
01.	බතික් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	100.00	70	98.236
02.	අත් යන්ත්‍ර පේෂකර්ම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	90.00	75	86.26
03.	පේෂකර්ම මධ්‍යස්ථානවල පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන.	65.00	80	60.26
04.	කුඩා පරිමාණ ඇඟලුම් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	30.00	30	26.46
	එකතුව	**285.00**		

2.1. බතික් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

දේශීය බතික් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ දේශීය බතික් කර්මාන්තය ප්‍රචලිත කිරීමය. 2021 වර්ෂයේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි බතික් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 60 ක් ස්ථාපිත කර ඇත.ඒ සඳහා රු.මි 98.236 ක් වැය කර ඇත.අඛණ්ඩව පුහුණු කිරීම් සඳහා 75 දෙනෙකු සම්පත් දායකයන් ලෙස පුහුණු කර ඇත. ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන සිදු කිරීමේ හා නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් බතික් නිෂ්පාදන පුහුණුලාභීන් 1200 දෙනෙකු පුහුණු කර ඇත.





පන්නල බතික් පුහුණු කිරීමේ වැඩමුළුව

2.2. අත් යන්ත්‍ර පේෂකර්ම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන



වවිනියාව වෙප්පන්කුලම අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා උපකරණ ලබා දීම.



වවිනියාව වෛරවපුලියන්කුලම අත්යන්ත්‍ර රෙදිපිළි අලෙවි සැල සඳහා අමුද්‍රව්‍ය ලබා දීම.

දැනට පවතින පේෂකර්ම මධ්‍යස්ථානවල නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීම සඳහා පොදු පහසුකම් ඇති කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව පළාත් 6 ක් සඳහා විදුලියෙන් ක්‍රියාත්මක වන වෝප් හා වයින්ඩින් යන්ත්‍ර මිලදී ගැනීම හා පේෂකර්ම පුහුණු ආයතන 7 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 60.26 ක් වැය කරනු ලැබීය.එමෙන්ම අත් යන්ත්‍ර නිෂ්පාදන ගම්මානවල වැඩසටහන යටතේ අත් යන්ත්‍ර මිලදී ගැනීම හා පුහුණු කිරීම සඳහා රු.මිලියන 86.26 ක් වැය කර ඇත.දැනට ගම්මාන 15 ක් ආරම්භ කර ඇත.මහනුවර නත්තරම්පොත ජාතිකමෝස්තර මධ්‍යස්ථානය ඩයි හා පිරිපහදු කිරීමේ ඒකක ඉදිකිරීම සඳහා රු.මිලියන 3 ක් වැය කරනු ලැබීය.අත් යන්ත්‍ර කර්මාන්තය නගා සිටුවීම තුලින් කර්මාන්තයේ නියැලී සිටින ජනතාවගේ ජීවන මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වා ගැනීමේ අරමුනින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය.

2.3. කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.

2025 වර්ෂය වනවිට ඩොලර් මිලියන 1000 ක් දේශීය ඇඟළුම් අපනයන ආදායමක් ඉලක්ක කර ගෙන සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණ වන පරිදි කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත ස්ථාපිත කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.ඒ අනුව 2021 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත 19 ක් ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ ලබා දී ඇත.මේ සඳහා රු.මිලියන 26.46 ක් වැය කර ඇත.

2.4 අමාත්‍යාංශය මඟින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් / ව්‍යාපෘති

පහත සඳහන් පරිදි 2022 වසර සඳහා සංවර්ධන වැඩසටහන් /ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර ඒවා ඒකාබද්ධ අරමුදල මඟින් මූල්‍යනය කෙරේ.

අනු අංකය	වැඩසටහන / ව්‍යාපෘතිය	අරමුණ	අපේක්ෂිත ආයෝජන (රු.මි)
01.	කුඩා පරිමාණ ඇඟලුම් කර්මාන්ත ස්ථාපිත කිරීමේ වැඩසටහන.	දේශීය ඇඟලුම් නිෂ්පාදනය ඉහළ නංවා අපනයනආදායමවැඩිකිරීම හා රෙදිපිළි ආනයනය සීමා කිරීම.	600.00
02.	බතික් නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන.	අපනයන ආදායම වැඩි කර ගැනීම හා දේශීය බතික් නිෂ්පාදන වැඩි කිරීම හා පරිභෝජනය ඉහළ නැංවීම.	100.00
03.	දේශීය අත් යන්ත්‍ර රෙදිපිළි ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	දේශීය අත් යන්ත්‍ර රෙදිපිළි භාවිතය ඉහළ නැංවීම හා දේශීය රෙදි නිෂ්පාදනකරුවන්ගේ ආදායම ඉහළ නැංවීම.	120.00
04.	බතික්, අත් යන්ත්‍ර කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම.	සුදුසු මධ්‍යස්ථානවල නව තාක්ෂණික උපකරණ ලබාදී ගුණාත්මකභාවය ඉහල නැංවීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	133.00
05	අලෙවි ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	දේශීය රෙදිපිලි විද්‍යුති හා දෘශ්‍යීයව ප්‍රචලිත කිරීම.	47.00
	එකතුව		**1000**

අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වැඩසටහන් ව්‍යාපෘති ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාලව 2 වන පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

පරිච්ඡේදය 3

වසරේ සමස්ත මූල්‍ය කාර්යය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4		-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		394,563,000	60,500,000.00	ඒසිඒ-3
	තැන්පතු		6,503,015	23,725.00	ඒසිඒ-4
800,000.00	අත්තිකාරම් ගිණුම්		4,150,853	516,863.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**405,216,867**	**61,040,588.00**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**405,216,867**	**61,040,588**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**306,821**	**468,404**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**404,910,046**	**60,572,184**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක				
65,870,000.00	ප්‍රතිලාභ	5	40,214,382	9,448,601.51	
101,640,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	43,594,322	4,158,794.20	ඒසිඒ-2(ii)
126,795,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	118,412,063	68,034,144.44	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
294,305,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**202,220,766**	**81,641,540**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
7,600,000.00	වැඩිදියුණු කිරීම්	10	4,025,344	863,455.76	
5,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,626,481	945,464.06	
718,600,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	476,837,522	136,976,122.00	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	129,978.73	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
731,200,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**482,489,347**	**138,915,020.55**	
	තැන්පතු ගෙවීම්		5,098,677	-	ඒසිඒ-4
5,000,000.00	අත්තිකාරම් ගෙවීම්		5,184,502	1,091,376.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
5,000,000.00	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**10,283,179**	**1,091,376.00**	
1,030,505,000.00	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		694,993,292	221,647,937	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ - එ)		(290,083,245)	(161,075,752.29)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(290,083,245)	-	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			-	ඒසිඒ-3
			(290,083,245)	-	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්ෂ 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	84,574,288.80	1,941,580.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	4,095,051.46	3,061,402.01
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	
මුළු වත්කම්		**88,669,340.26**	**5,002,982.01**
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		2,666,988.56	3,037,677.01
දේපළ පිරියත හා උපකරණ සංචිතය		84,574,288.80	1,941,580.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රාග්ම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,428,062.90	23,725.00
අදිම ශේෂය	ඒසිඒ-3	-	
මුළු වගකීම්		**88,669,340.26**	**5,002,982.01**

පිටු අංක 01 සිට 37 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 38 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට එරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 2022/02/23	දිනය : 21/2/2022
ජේනරාල් දයා රත්නායක ලේකම් කර්මාන්ත ... 73/1, ...	ඩී.එල්.ඒ.ජේ.ධර්මකීර්ති ලේකම් බනික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	සී. ප්‍රියදර්ශිකා රුවන්පිටිය ප්‍රධාන ගණකාධිකාරි බනික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ආදායම් නොවන ලැබීම්	353,947	9,821,932
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,701,194	265,593
අග්‍රිම ලැබීම්	394,563,000	60,500,000
අත්තිකාරම් අයකර ගැනීම්	950,300	516,863
තැන්පතු ලැබීම්	790,686	23,725
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**398,359,126**	**71,128,113**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	83,802,904	13,607,396
සහනාධාර සහ මාරුකිරීම්	1,443,063	20,894
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	336,486	4,410,360
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	306,821	4,249,204
අත්තිකාරම් ගෙවීම්	1,906,359	1,091,376
තැන්පතු ගෙවීම්	5,098,677	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**92,894,309**	**23,379,230**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**305,464,817**	**47,748,883**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	305,464,817	47,748,883
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**305,464,817**	**47,748,883**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(305,464,817)**	**(47,748,883)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම්

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාල නැත

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු)		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	250,000,000	294,305,000	202,220,766	70%
ප්‍රාග්ධන	692,600,000	731,200,000	482,489,346	67%

3.7 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් අනුව වියදම් සාරාංශය

ඒසීඒ -2

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

439 - බනික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	170,000,000.00	-	-	170,000,000.00	85,251,766.30	84,748,233.70
	(2) ප්‍රාග්ධන	12,600,000.00	-	-	12,600,000.00	5,651,825.03	6,948,174.97
	උප එකතුව	**182,600,000.00**	-	-	**182,600,000.00**	**90,903,591.33**	**91,696,408.67**
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	80,000,000.00	44,305,000.00	-	124,305,000.00	116,969,000.00	7,336,000.00
	(2) ප්‍රාග්ධන	680,000,000.00	38,600,000.00	-	718,600,000.00	476,837,521.63	241,762,478.37
	උප එකතුව	**760,000,000.00**	**82,905,000.00**	-	**842,905,000.00**	**593,806,521.63**	**249,098,478.37**
	මුළු එකතුව	**942,600,000.00**	**82,905,000.00**	-	**1,025,505,000.00**	**684,710,112.96**	**340,794,887.04**

3.8 මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දි.ලේ කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු.000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	SLITA	බනික් ගම්මාන 160ක් ස්ථාපිත කිරීම	95,121	95,121	95,121	100%
2	ශ්‍රී ලංකා පදනම් ආයතනය	බනික් පුහුණු වැඩ සටහන්	4,440	4,440	4,440	100%
3	National Design Center	බනික් පුහුණු වැඩ සටහන්	10,107	10,107	10,107	100%
4	ප්‍රධාන ලේකම්-වයඹ පළාත	නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට පොදු පහසුකම්	33,853	33,853	33,853	100%
5	ප්‍රධාන ලේකම්-මධ්‍යම පළාත	නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට පොදු පහසුකම්	20,610	20,610	20,610	100%
6	ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	බනික් පුහුණු වැඩ සටහන්	2,640	2,640	2,640	100%
7	ප්‍රධාන ලේකම්-දකුණු පළාත	උපකරණ මිලදී ගැනීම	28,299	28,299	28,299	100%
8	වයඹ පළාත් කර්මාන්ත අධ්‍යක්ෂක	කටින චීවරයට අදාලව පළාත් සභාව වෙත මුදල් ගෙවීම	16	16	16	100%
9	ප්‍රධාන ලේකම්-නැගෙනහිර පළාත	බනික් ගම්මාන 4ක් ස්ථාපිත කිරීම	8,989	8,989	8,989	100%
10	ප්‍රධාන ලේකම්-උතුරු පළාත	උපකරණ මිලදී ගැනීම	9,000	9,000	9,000	100%
11	ප්‍රධාන ලේකම්-උතුරු මැද පළාත	උපකරණ මිලදී ගැනීම	19,290	19,290	19,290	100%
12	ප්‍රධාන ලේකම්-ඌව පළාත	මධ්‍යස්ථාන ඉදිකිරීම	28,246	28,246	28,246	100%
13	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව	උපකරණ මිලදී ගැනීම	1,220	1,220	1,220	100%
14	සභාපති-ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	තනාපතිවරුන් වෙත මුදල් යැවීම	1,600	1,600	1,600	100%
	ප්‍රධාන ලේකම්-සබරගමු පළාත	බනික් ගම්මාන 03ක් ස්ථාපිත කිරීම	9,116	9,116	9,116	100%
එකතුව			272,546	272,546	272,546	

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	4,244,288	4,244,288	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/B/MIN/10/2021/FS
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2022 මැයි 18 දින

අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය

බනික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

බනික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බනික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බනික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට විගණිත ජංගම නොවන වත්කම් වටිනාකම රු.2,613,594ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් වටිනාකම ලෙස රු.1,941,580ක වටිනාකමක් අන්තර්ගත කර තිබුණි. ජංගම නොවන වත්කම් වල පෙර වර්ෂ අවසන් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.672,014 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය 2020 වර්ෂයේ දී රු.2,613,594ක් සහ සමාලෝචිත වර්ෂයේ දී රු.1,626,481 වටිනාකමක් හා කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් රු.341,300 ක් ලෙස 2021 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.4,581,375ක් වන ජංගම නොවන වත්කම් ලබාගෙන තිබුණි. භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ SA 82 හි ජංගම නොවන වත්කම් පිළිබඳ සාරාංශ වාර්තාව ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය වර්ෂය තුළ මිලට ගත් වත්කම් වටිනාකම ලෙස යන්ත්‍ර හා උපකරණ යටතේ පමණක් රු.3,093,716 වටිනාකමක් පමණක් වාර්තා කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය වෙත අයිතිය පවරාගෙන නොමැති කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලද එකතු වටිනාකම රු.58,930,000 ක් වන වාහන 9ක් හා මුදල් අමාත්‍යාංශයෙන් ලද එකතු වටිනාකම වූ රු.21,500,000 වාහන 3ක් ලෙස එකතු වටිනාකම රු.80,430,000 ක් වූ වාහන 12ක වටිනාකම අමාත්‍යාංශයේ ජංගම නොවන වත්කම් තුළ ඇතුලත් කර තිබුණි. ඉහත සඳහන් වාහන 12න් එකතු වටිනාකම රු.36,230,000ක් වූ වාහන 6ක වටිනාකම් කර්මාන්ත අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන වල ද ඇතුලත්ව තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් හා දේපළ පිරියත උපකරණ සංචිත එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාල රෙගුලාසි	නිරීක්ෂණය
(i)	බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	සමාලෝචිත වසර තුළ පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ii)	වැය ලෙජරය	මුදල් රෙගුලාසි 447	නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.
(iii)	පොදු තැන්පත් ලේඛනය	මුදල් රෙගුලාසි 571	නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.
(iv)	හානි පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110	නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම් වලට එළඹීම

(අ) මුදල් රෙගුලාසි 94 (2) හා (3) ප්‍රකාරව එලඹෙන ලද බැඳීම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දරන ලද රු.996,091 ක් වූ වියදම්, බැරකම් ලෙස ඇතුළත්ව නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.4,359,899ක් වූ බැරකම් සඳහා අමාත්‍යාංශය එළඹ තිබුණද, එම වටිනාකම භාණ්ඩාගාරයට වාර්තා නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයේ මාසික බැරකම් / සංචිත සාරාංශ වාර්තාවෙහි (SA 90) බැරකම් සම්බන්ධ කිසිදු තොරතුරක් ඇතුළත් වී නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව

නිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 අවධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇඟළුම් නිෂ්පාදන ආයතනයන් සඳහා නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ බෙදා දීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ යෝජනාව 2021 ජූලි 26 දින අමාත්‍යාංශ ලේකම් වෙත වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කර තිබුණ ද, මිලදී ගත යුතු උපකරණ, ප්‍රමාණ, වියදම් ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය මිලදී ගැනීම් කටයුතු සිදු කිරීම 2021 නොවැම්බර් 29 දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව අවශ්‍ය මිලදී ගැනීම් සඳහා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත අංක 388109 දරණ රු.26,436,790ක්වූ චෙක්පත 2021 දෙසැම්බර් 31 දින ලියා තිබුණ ද විගණන දිනය වූ 2022 අප්‍රේල් 6 දක්වා එම චෙක්පත නිකුත් කර නොතිබුණු අතර චෙක්පත නිකුත් කර අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. කොට අවශ්‍ය භාණ්ඩ ලබාගෙන නොතිබුණි. මු.රෙ. 137, 138, 139 ප්‍රකාරව අනුමත කිරීමේ, සහතික කිරීමේ හා ගෙවීමේ නිලධාරීන් සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම අදාල භාණ්ඩ නිවැරදි ලෙස භාරගෙන ඇති බවට, සෑම වවුචරයක්ම සම්පූර්ණ බවට ගණන් දීමේ නිලධාරියාට වගකිව යුතු වුවත්, උක්ත ගෙවීම් ඉහත රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූල නොවන ලෙස සිදු කර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2021 සැප්තැම්බර් 06 දින ඉදිරිපත් කර තිබූ ප්‍රතිශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 500 ක් වෙන් කර තිබුණ අතර 2021දෙසැම්බර් 31 දින රු.මිලියන 302.31 ක් වැය කර තිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු මිලියන 15 ක් වූ ව්‍යාපෘතින්

2021 වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණු අතර දේශීය ඇඟළුම් ගම්මාන 30 ක් ස්ථාපිත කිරීම සඳහා රු මිලියන 30 ක් වෙන් කර තිබුණද ගම්මාන 19 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. දේශීය බනික් හා ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කර ඇතත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම කිරීමක් සිදුකර නොතිබුණි.

3.2 **ප්‍රසම්පාදනයන්**

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති 2020/02 චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් අමාත්‍යාංශයේ වාර්ෂික පුනරාවර්තන සහ ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපතක් ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි. ඒ අනුව 2021 වර්ෂය සඳහා රු.මිලියන 3,550 ක්වූ ප්‍රාග්ධන ප්‍රතිපාදනය නිසි සැලැස්මක් තුල සිදුකර නොතිබුණි.

(ආ) 3.4.3 වගන්තිය ප්‍රකාරව දැන්වීම් පලකිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමකින් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හා නිතර භාවිතා කරන අයිතමයන් මිලදී ගැනීම සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන නොතිබුණි.

3.3 **රජයේ නිලධාරීන් ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 9 ඡේදය ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් සඳහා ඇප තැබීමක් සිදුකර නොතිබුණි.

3.4 **පාඩු හා හානි**

(අ) 2021 නොවැම්බර් 22 දින අංක KS - 2354 දරන රථයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) වගන්තිය ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් නිකුත් කර අනතුරේ ස්වභාවය, එහි ප්‍රමාණය යන කරුණු අනාවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු විගණිත දින තෙක් කර නොතිබුණ අතර මේ පිළිබඳ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය යටතේ මුල්‍ය ප්‍රකාශ වල දක්වා නොතිබුණි..

(ආ) අංක PE –1858 දරණ කැබ් රථය 2021 ජනවාරි 13 දින අනතුරකට ලක් වී තිබුණි. මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව නිකුත් කිරීම 2021.ඔක්තෝබර් 29 දක්වා ප්‍රමාද වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට 2022 පෙබරවාරි 10 දින දක්වා ප්‍රමාද වී තිබුණි. මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශ වල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුව අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු 21 ක් සඳහා සේවක සංඛ්‍යාව 59 ක් අනුමත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 28 වූයෙන් තනතුරු 13ක් සඳහා සේවකයින් 31 ක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු , කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපා තිබුණි. මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් , අධ්‍යක්ෂ , සහකාර අධ්‍යක්ෂ , සහකාර ලේකම්, අභ්‍යන්තර විගණක යන තනතුරු පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ සහකාර ලේකම් වරයෙකු වෘත්තීය සමීති හා සේවක සබඳතා සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තාවකාලික පදනම් මත බඳවාගෙන තිබුණි.

(එච්.එම්.යූ.එස්.ඒ විජේකෝන්)
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 4

කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යය සාධන දර්ශක (වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමෙහි ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
තාක්ෂණික හුවමාරු වැඩ සටහන යටතේ පිහිටුවා ඇති බතික් පුහුණු මධ්‍යස්ථාන ගණන.	✓		
නව මෝස්තර 100 වැඩසටහනට අනුව අළුතින් බතික් මෝස්තර වැඩි දියුණු කිරීම.	✓		
බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා නව වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම සම්පූර්ණ කිරීමෙහි ප්‍රතිශතය.	✓		
අත්යන්ත්‍ර පේෂකර්ම පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.		✓	

පරිච්ඡේදය 5

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය /අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 - 49	50 - 74	75 - 100
ඉලක්ක 9: කර්මාන්ත නවෝපාදනය හා යටිතල පහසුකම් - ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම,සියල්ල ඇතුළත් හා තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණයන් පෝෂණය කිරීම.	9.3	9.3.1 සමස්ත කර්මාන්ත අගය එකතුකිරීමේදී කුඩා පරිමාණ කර්මාන්තවල සමානුපාතය. බතික් කර්මාන්තයේ දේශීය වෙළඳපොළෙහි වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම. බතික් මෝස්තර 100 ක් වැඩි දියුණු කිරීම.			100%
	9a	9.a.1 යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පූර්ණ (ජාත්‍යන්තර.දේශීය)සහයෝගය බතික් අත් යන්ත්‍ර හා දේශීය ඇඟළුම් නිෂ්පාදනවල		√	100%

		පාර්ශවකරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම. බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට නව වෙබ් අඩවියක් සැපයීම.			
	9.5	දළ දේශීය නිෂ්පාදිතයේ සමානුපාතිකයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන වියදම්. බතික් කර්මාන්තකරුවන්ට දැනුම හා තාක්ෂණය හුවමාරු කිරීම. ගල්ගමුව, නුගවෙල ,නිකවැරටිය ,පන්නල,වෙලනායි, තමන්කඩුව,කඹුරුපිටිය, රත්මලාන යන ප්‍රදේශවල බතික් පුහුණු මධ්‍යස්ථාන 8 ක් ස්ථාපිත කිරීම.			80%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2021 වර්ෂය තුල දිවයිනේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමට නොහැකි වීම හා වෙළඳ පොලේ භාණ්ඩ / අමු ද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් සැලසුම් කරන ලද ඉලක්ක වෙත ලඟාවීමට අපහසු විය.

පරිච්ඡේදය 6
මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු /අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	12	08	04
තෘතියික	02	01	01
ද්විතියික	28	06	22
ප්‍රාථමික	16	10	06
තාවකාලික	04	03	01
එකතුව	**62**	**28**	**34**

	තනතුර	සේවය	ශ්‍රේණිය/පන්තිය
ජ්‍යෙෂ්ඨ	ලේකම්		
	අතිරේක ලේකම්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ
	අතිරේක ලේකම් (සංවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ
	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	1
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ	1
	අධ්‍යක්ෂ (සංවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ	1
	අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේ	1
	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ක්‍ර.සේ	111/11
	සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ	111/11
	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	111/11
	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ	111/11
තෘතියික	පරිපාලන නිලධාරී	කළ සේ.නි සේ.	අධි පන්තිය
	ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	තාවකාලික	-
ද්විතියික	සංවර්ධන නිලධාරී	සං.නි.සේ	111/11/1
	රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී	කළ සේ.නි සේ.	111/11/1
	තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර	තො.ස.තා.සේ	3-111/11/1
ප්‍රාථමික	රියදුරු	ඒ.රි.සේ	111/11/1 විශේෂ
	කාර්යාල සේවක සේවය	කා.සේ.සේ	111/11/1 විශේෂ
තාවකාලික	වීඩියෝ කැමරා ශිල්පී	තාවකාලික	-
	නිශ්චල ඡායාරූප ශිල්පී	තාවකාලික	-
	කැමරා ශිල්පී සහයක	තාවකාලික	-
	අලෙවි ප්‍රවර්ධන සහයක	තාවකාලික	-

6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය සංවිධානයේ කාර්ය සාධනය කෙරෙහි ඇති කරන බලපෑම

මානව සම්පත් අතිරික්තයක් නොමැත. මානව සම්පත්හි විශාල හිඟයක් පවතී. සම්පූර්ණ අනුමත කාර්ය මණ්ඩලය 62 කි. එහෙත් සේවයේ නියුතු සංඛ්‍යාව 28 කි. ද්විතික ගණයේ අනුමත සේවක සංඛ්‍යාව 28 කි. එහෙත් සේවයේ නියුතුව ඇත්තේ 06 කි. කළමණාකරණ සේවා නිලධාරීන් 11 දෙනෙකු අනුමතව ඇතත් දැනට සේවයේ නියුක්තව සිටින්නේ එක් නිලධාරියෙකු පමණි.

මෙයට අමතරව රැකියා විරහිත උපාධිධාරීන් /ඩිප්ලෝමාධාරීන් රැකියා ගත කිරීමේ වැඩසටහන 2020 යටතේ පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති පුහුණුලාභීන් 11 දෙනෙකු 2021.12.31 දින වන විට පුහුණුව ලබමින් සිටියි.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු වැඩසටහන් - 2021

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු)	වැඩසටහනේ ස්වභාවය	නිමැවුම් /ලබාගත් දැනුම
කාර්යාල ක්‍රම	30	2021.11.11 දින	රු.30,000.00	දේශන හා සාකච්ඡා	නිවැරදිව කාර්යාල ක්‍රම භාවිතය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	2021.10.26	රු.5,000.00	මාර්ගගත	නිවැරදිව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටුකිරීම.
කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි	01	2021.11.11 2021.11.12	රු.10,000.00	මාර්ගගත	මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	01	2021.11.12 2021.11.19 2021.11.29	රු.15,000.00	මාර්ගගත	භාණ්ඩ සමීක්ෂණයක් නිවැරදිව සිදු

					කරන ආකාරය
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	01	2021.11.29	රු.5,000.00	මාර්ගගත	වැටුප් සකස් කිරීම
පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගැනීම.	01	2021.11.23	රු.5,000.00	මාර්ගගත	පෞද්ගලික ලිපි ගොනුවක් නිවැරදිව පවත්වා ගැනීම.

2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු විය.

- **ආයතනයේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

  මෙම අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් වීම හා නවක නිලධාරී මණ්ඩලයක් සිටීම නිසා පවත්වන ලද පුහුණු වැඩසටහන් , ආයතනයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හේතු වී ඇත.

පරිච්ඡේදය 7
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.6	වෙනත්	අදාල නොවේ.		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර තවමත් පුරප්පාඩුව පවතී.	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර තවමත් පුරප්පාඩුව පවතී.	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ.	කල්බදු ක්‍රමයට ගත් වාහන නොමැත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		.
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		2020 වර්ෂයේ පිහිටවූ නව අමාත්‍යාංශයක් වන හෙයින් පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කරමින් පවතී.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		2020 වර්ෂයේ පිහිටවූ නව අමාත්‍යාංශයක් වන හෙයින් මෙම තොරතුරු සම්පාදනය කරමින් පවතී.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	සකස් කර ඇත.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		